ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ I ශ්‍රේණියේ සියලුම නිලධාරීන්ගේ දැනගැනීම සඳහා

**<u>ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ I ශ්‍රේණියේ පුරප්පාඩු</u>**

ශ්‍රී ලං.ග.සේ. I ශ්‍රේණියේ 2025.04.01 දිනට පවතින පුරප්පාඩු තනතුරු ලේඛනය මෙම අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ පළකර ඇත.

02. 2023.10.11 දිනැති රා.සේ.කො. සභා චක්‍රලේඛ 04/2023හි 6.1 වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව ඉහත තනතුරු සඳහා දැනටමත් I ශ්‍රේණියේ තනතුරු දරන නිලධාරීන් හට ස්ථානමාරු ලබාගැනීමේ හැකියාව ඇත.

03. ඉන් අනතුරුව තවදුරටත් ඉතිරි වන I ශ්‍රේණියේ පුරප්පාඩු තනතුරු සඳහා ශ්‍රී ලං.ග.සේ. II/III ශ්‍රේණියට අයත් තනතුරු දරන ශ්‍රී ලං.ග.සේ. I ශ්‍රේණියේ නිලධාරීන් සඳහා 2025.05.31 දින දක්වා පූර්ණකාලීනව වැඩබැලීමේ පත්වීම් ලබාදීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙසට අංක PSC/PRO/07/2017/2023 හා 2025.03.21 දිනැති රාජ්‍ය සේවා කොමිෂන් සභා තීරණය මඟින් දන්වා ඇත.

04. එපරිදි ඉදිරි කටයුතු සිදුකිරීමට නියමිත බැවින් ඉහත 02 ඡේදය පරිදි ඔබගේ ඉල්ලීම් පහත ලිපි ලේඛන සමඟ 2025.04.22 දිනට පෙර මෙම අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය.

I. නිලධාරියාගේ ඉල්ලීම් ලිපිය
II. ස්ථානමාරු වීමට අපේක්ෂා කරන ආයතන ප්‍රධානියාගේ එකඟතාවය
III. නිලධාරියා නිදහස් කිරීම සම්බන්ධ වර්තමාන ආයතන ප්‍රධානියාගේ නිර්දේශ
IV. EST 12 ආකෘති පත්‍රය (I ශ්‍රේණියේ තනතුරකට ස්ථාන මාරුවීම සඳහා) / EST 04 ආකෘති පත්‍රය (පූර්ණකාලීනව වැඩ බැලීම සඳහා)
V. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් තනතුර අනුමත කිරීමේ ලිපිය

දිනය : 2025.04.03

එච්.ඒ.ඩී.සී. ජයසේකර
අතිරේක ලේකම් (රාජ්‍ය පරිපාලන)
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ
ලේකම් වෙනුවට